# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 17 දරන
# ශ්‍රී ලංකා ඉස්ලාමීය පුනර්ජීවන ව්‍යාපාර සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 25 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 මාර්තු මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.**

---

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය**

මිළ: ශත 60 යි. තැපැල් ගාස්තුව: රු. 1.00 යි.

## 1992 අංක 17 දරන ශ්‍රී ලංකා ඉස්ලාමීය පුනර්ජීවන ව්‍යාපාර සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 25 වන දින]

එල්. ඩී.—ඕ. 31/84

**ශ්‍රී ලංකා ඉස්ලාමීය පුනර්ජීවන ව්‍යාපාර සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

'ශ්‍රී ලංකා ඉස්ලාමීය පුනර්ජීවන ව්‍යාපාර සංගමය' යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් ඒ සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු එලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කර ගෙන යාමේ කාර්ය සඳහා මෙතෙක් කල් කොළඹ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ එම සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම්කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1992 අංක 17 දරන ශ්‍රී ලංකා ඉස්ලාමීය පුනර්ජීවන ව්‍යාපාර සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා ඉස්ලාමීය පුනර්ජීවන ව්‍යාපාර සංගමය සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන්පසු (මෙහි මින්මතු 'සංගමය' යනුවෙන් හඳුන්වනු ලබන) කොළඹ, ශ්‍රී ලංකා ඉස්ලාමීය පුනර්ජීවන ව්‍යාපාර සංගමයේ සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින්මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු 'සංස්ථාව' යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා ඉස්ලාමීය පුනර්ජීවන ව්‍යාපාර සංගමය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු ය. එය විසින් හා එයට විරුද්ධව එකී නාමයෙන් සියලු අධිකරණයන්හි නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම ද කළ හැකි වන්නේ ය. තවද, එකී නාමයෙන් පොදු මුද්‍රාවක් තබා ගැනීමට ද පාවිච්චි කිරීමටද සංස්ථාවේ කැමැත්ත පරිදි එය වෙනස් කිරීමටද සම්පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාව අතර ඉස්ලාමීය සහෝදරත්වය, සුහදතාවය සහ එකමුතු බව පෝෂණය කිරීම ;

(ආ) මුස්ලිම් ප්‍රජාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගන්නා අතරම, අනිකුත් ජන කොටස් සමඟ සහජීවනාත්මක පරිසරයක් පවත්වාගෙන යාම සහ එය පෝෂණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) ශ්‍රී ලංකාවේ වාසය කරන මුස්ලිම් ප්‍රජාවගේ ආගමික, අධ්‍යාපනික, සමාජයීය සහ ආර්ථික රටාවෙහි පවත්නා ගැටළු අධ්‍යයනය කිරීම සහ නිර්මාණාත්මක යෝජනා ඉදිරිපත් කිරීම සහ සහයෝගය දීම ද, ඒ කාර්යය සඳහා ශ්‍රී ලංකාව මුළුල්ලේ ම ශාඛා සමිති පිහිටුවා ඒවා ප්‍රවර්ධනය කිරීමෙන් සංස්ථාවේ ක්‍රියාකාරකම් පුළුල් කිරීම;

(ඈ) ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාවගේ සංස්කෘතික, සදාචාරාත්මක, අධ්‍යාපනික, සමාජයීය සහ ආර්ථික සුභසාධනය සඳහා රජයේ, ස්වේච්ඡා සංවිධානවල සහ වෙනත් තැනැත්තන්ගේ උපකාරය සහ සහයෝගය ලබාගැනීම;

(ඉ) දිළිඳු සහ පිළිසරණ අවශ්‍ය මුස්ලිම් සිසුන් හට සහාය දීම සහ ඔවුන් හට ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි හෝ ඔවුන්ගේ අධ්‍යයන කටයුතු තවදුරටත් කරගෙන යාමට හැකිවන සේ උපකාර කිරීම;

(ඊ) ඉස්ලාමීය සංස්කෘතිය සහ ආගම හැදෑරීම පෝෂණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම; සහ

(උ) ඉහත කී පරමාර්ථ අත්කර ගැනීම සඳහා ආනුෂංගික වූ හෝ හිතකර වූ හෝ වෙනත් ක්‍රියාකාරකම්වල නිරතවීම.

මෙම වගන්තියෙහි "මුස්ලිම්" යන වචනයෙන් ඉස්ලාම් ආගම අදහන තැනැත්තෙක් අදහස් කරයි.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවක මණ්ඩලය සේවයට ගැනීමේ, සේවයේ නියුක්ත කර ගැනීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ අතුරින් යම් කිසිවක් වැඩි දියුණු කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය කවරාකාරයේ වූ හෝ සියලු ක්‍රියා කිරීමේද, සියලු කරුණු ඉටු කිරීමේ සහ සියලු දේ ක්‍රියාත්මක කිරීමේ ද බලය සංස්ථාවට තිබිය යුතු ය.

පාලක මණ්ඩලය.

5. (i) සංස්ථාවේ බලපවත්නා රීති අනුව තෝරා ගනු ලැබිය හැකි නිලධරයන්ගෙන් හා සෙසු තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත වන පාලක මණ්ඩලයක් විසින් සංස්ථාවේ බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු පරිපාලනය කළ යුතු ය.

(ii) මේ පනත ආරම්භ වන දිනයෙහි සංගමයේ පාලක මණ්ඩලය මේ පනත යටතේ සංස්ථාවේ ප්‍රථම පාලක මණ්ඩලය විය යුතු අතර, මේ පනත ආරම්භ වන දිනයේ සිට වර්ෂ දෙකක කාලයක් ධුර දැරිය යුතු ය:

එසේ වුවද සංගමයේ ජාතික සභාපතිවරයා වූ සාමදාන විනිශ්චයකාර තැන්පත් එම්. අයි. එම්. නලීම් මහතා කලින් ඉල්ලා අස් වුවහොත් මිස, සංස්ථාවේ ජාතික සභාපතිවරයා, භාරකාර මණ්ඩලයේ සාමාජිකයෙකු සහ පාලක මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තම ජීවිත කාලය තුළ ධුර දැරිය යුතු ය.

භාරකාර මණ්ඩලය.

6. සංස්ථාවේ සියලුම නිශ්චල දේපළවල ආරක්ෂක භාරකාරත්වය සංස්ථාවේ බලපවත්නා රීතිවලට යටත්ව, ඉස්ලාම් භක්තික වැදගත් තැනැත්තන් තිදෙනෙකුගෙන් සමන්විත සංස්ථාවේ භාරකාර මණ්ඩලය වෙත සංස්ථාවේ බලපවත්නා රීතිවලට අනුකූලව පවරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ රීති.

7. (1) පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී හා පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක වැඩි ඡන්දයකින්, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන පහත සඳහන් කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් රීති සාදා ගැනීම පාලක මණ්ඩලයට නීත්‍යානුකූල විය යුතු ය :—

(අ) සංස්ථාවේ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම ;

(ආ) සංස්ථාවේ පාලක මණ්ඩලයේ සහ භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම, පත් කිරීම සහ ඉවත් කිරීම ;

(ඇ) පාලක මණ්ඩලයේ, භාරකාර මණ්ඩලයේ සහ විවිධ අනු කාරක සභාවල නිලධරයන් සහ සංස්ථාවේ අනුයෝජිතයන්ගේ කාර්යය ඉටු කිරීම ;

(ඈ) ගනුදෙනු සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ගද, එකී අරමුදල් වල භාරකාරත්වය පවත්වා ගෙන යාම හා ගිණුම් විගණනය කිරීම ; සහ

(ඉ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) පාලක සභාව විසින් සාදනු ලැබූ යම් රීතියක් (1) වන උප වගන්තිය යටතේ සාදනු ලැබූ රීතියක් පරිදි එවැනිම රැස්වීමකදී එය සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ කළ හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු හා සංගමයට අයවිය යුතු ණය.

8. මේ පනතේ කාර්යයන් සඳහා මේ පනත ආරම්භ වන දිනයේදී පවත්නා සංගමයේ සියලුම ණය හා බැර කම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, සංගමයට අය විය යුතු සියලු දායක මුදල් හා සාමාජික මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

9. භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. එකී සාමාජිකයන් තිදෙනා පැමිණ සිටීමේ ලකුණක් වශයෙන් එකී ලේඛනයේ තම නම අත්සන් කළ යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**10.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, තෙස්ත මේන්තු නියාදනයක් ප්‍රකාර හෝ අන් ආකාරයකින් සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීමටත් සතුව සිටීමටත් නීත්‍යනුකූලව සංස්ථාවට හැකියාව ඇත්තේ ය. තවද විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හෝ අන් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ තත් කාලයෙහි බල පවත්නා රීති වලට යටත්ව එකී සියලු දේපළ දැරිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මේ පනතේ සඳහන් තැනැත්තන් හා ඔවුන් වෙනුවෙන් ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම් වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**12.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 870 කි (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.